# නාඩගම් පෙළ ගැසෙන අන්දම

අප පසුගිය ලිපි වල සඳහන් කළ ගැමි නාටක මෙන්ම නාඩගම් ද අවසන් වන විට එළි වෙයි. එක් නාඩගමක් දවස් හතක් රඟපෑමේ චාරිත්‍රයක් අතීතයේ තිබුණි. අතීතයේ නාඩගම් බැලීමට ගිය ප්‍රේක්ෂකයන් පැදුරු කොට්ට ද රැගෙන ගිය බව අපේ  සීයා මට කියා තිබේ.

නාඩගම පටන් ගනු ලබන්නේ පූර්ව රංගනයෙනි. එනම් බහුබූතයා, සෙල්ලන් ළමා, බෙරකාරයා ආදී ස්ථාවර පාත්‍රයන් ඉදිරිපත් කරන භාගයෙන් පටන් ගන්නා රංගනය නාට්‍ය කතාවට පැමිනි කල පෙර දින රාත්‍රියේ නතර කරන ලද ස්ථානයෙන් නැවත පටන් ගෙන රඟ දක්වනු ලැබේ. කරළිය යන නිමන් හැඳින්වෙන නාඩගම් රංග භූමිය එළිමහනක පන් ගොඩ ගසා පොළොවේ මට්ටමින් අඩි කීපයක් උස් කොට අර්ධ කවාකාරයට තනන්නකි. කරළියෙන් පිටතට නෙරා එන්නට සළස්වා ඊට යාබදව පොල් අතු මඩුවක් තනනු ලැබේ.  මේ මඩුව වහල ඉදිරියට විත් කරලිය ආවරණය වන අයුරින් කනු දෙකක් සිටුවා සාදනු ලැබේ. මඩුවත් කරළියත් අතර සිතුවම් කරන ලද තිර දෙකක් එල්ලා තිබේ. මේ තිර වලින් කරළියත් මඩුවත් වෙන් වෙයි. මෙම තිර භාවිතා කිරීමට පෙර පිටුපස වූයේ ගැමි නාටක වල මෙන් කඩතුරාවක් පමණක් බව සඳහන් වේ.

නෙපථ්‍යාගාරයක් (Dressing Room) වශයෙන් පාවිච්චිකරන මේ මඩුව නළුවන් කරළියට පැමිණීමට යොදාගනු ලැබෙයි.

මුලින්ම කරළියට පැමිණෙන්නේ පොතේ ගුරුන්නාන්සේ ය. පොගේ ගුරුන්නාන්සේ කරළිය පිටුපසින් සිට පිවිසෙන නළුවන් හා ඉදිරියෙන් ඉඳගෙන ඉනානා ප්‍රේක්ෂකයන් යන දෙගොල්ලන් ම පෙනෙන සේ ප්‍රවේශස්ථානයෙහි සිටගෙන සිටියි. ඔහු ළඟ අත්වැල් ගායකයන් දෙතුන් දෙදෙනෙක් සිටිති.

පොතේ ගුරුන්නාන්සේගේ සම්ප්‍රදායික වේශය පළල් දිග අත් වලින් යුත් සුදු ලෝගුවක් හා හිසට ජටාවක් පැළඳීමයි. මෙම ලෝගුව ඉන්දියාවේ බ්‍රාහ්මණයන් අඳින ලෝගුවත් බටහිර ලෝගුවත් යන දෙකෙහි සංකලනයක් යයි මහාචාර්ය සරච්චන්ද්‍රයෝ කියති.

රැඟුම් ආරම්භ වන්නේ පොතෝ ගුරුන්නාන්සේ ආරම්භක ගීය ගයන තැන සිට ය. ආරම්භක ගීතයෙන් කෙරෙන්නේ නමස්කාරය හා ප්‍රේක්ෂකයන්ගෙන් සමාව අයැදීම යනාදියයි. ඉන්පසුව පොතේ ගුරුන්නාන්සේ නාඩගමට අයත් ස්ථාවර ප්‍රත්‍රයන් එකිනෙකා ඉදිරිපත් කරන්නට පටන් ගනියි.

***පොතේ ගුරුන්නාන්සේ ගේ ගීයක්***

දෙරණ මනු මෘග පක්ෂි
සව් සතුන් සර්ව දේ
අනිලනල ජලය නා..

ගගන දිසි තරු විවිද
දිලෙන හිරු සඳ මඬල
මොලෝ හෙළකර දෙනා

බෙලෙන සිය තෛක්‍රලෝක නිමිති කළ
පරමේශ්වර අනාදි ස්වයම්භ වූ අමර නා

සරණ යුග දී නිතින් ගැත් මෙමා
රකීවා සදාකල් කුළුනිනා

පොතේ ගුරුන්නාන්සේ ඉන්නා තැනට ඉදිරියෙන්  අනික් පැත්තේ වාදක මණ්ඩලයද අත්වැල් ගායකයෝද සිටිති. බෙර වාදකයෝ දෙදෙනෙක් හොරණෑකරුවෙක්, කයිතාලම් ගසන්නෙක් ද වාදක මණ්ඩලයට අයත් වෙති.

නාඩගම් වලට වාදනය කරන බෙර විශේෂයට මන්තාලම් කියාද මද්දලය කියා ද නැතහොත් දෙමළ බෙරය කියා ද ව්‍යවහාර කරනු ලැබෙයි. මද්දලය නාඩගම් සමග බද්ධ වී තිබෙයි. මද්දලය නොමැති නම් නාඩගමක් නොමැත්තා සේ ය.

මෑත අවදියක බටහිර වාද්‍ය භාණ්ඩයක් වන වයලීනය හා සර්පිනාව  හොරණෑව වෙනුවට පාවිච්චි කරන්නට යෙදුන බව සඳහන් වෙයි.

පළමුවෙන් ම සබයට එන්නේ බහුබූතයා ය. ඔහු සංස්කෘත නාට්‍යයෙහි එන විදූෂකයා සිහි කරන විහිළු කාරයා ය. ඔහුට කෝමාලි, බහුබූත කෝලමා, කොනංගි වශයෙන් නොයෙක් නම් ඇති බව පෙනේ. සියළුම පාත්‍රයන් හඳුන්වන විට එක්තරා පිළිවෙලක් අනුගමනය කරනු ලැබේ. බහුබූතයාට නියමිත නැටුමක් තිබේ. සමහර විට බහුබූතයෝ දෙතුන් දෙනෙක් විත් නටති. ඔවුන්ගේ නැටුම් වල අතරින් පතර පොතේ ගුරුන්නාන්සේ නොයෙක් ප්‍රශ්න අසා ඔවුන් හා සංවාදයේ යෙදෙයි.

බහුබූත ඇඳුම තද කලිසමක් හා මදක් දිග බුරුල් හැට්ටයක් ඇඳ වක් ගැසුණ තොප්පියක් ය. ඔහුගේ කලිසමේ හා හැට්ටයේ වෛවර්ණ අල්ලි පේලියට අල්ලා ඇත.

ඉන් අනතුරුව සබයට එන්නේ සෙල්ලන් ළමා හෙවත් සෙල්ලං පිල්ලෙ ය. ඔහු ධෝතියක් ද ඇඳ බොත්තම් පේලියකින් පියවන ලද විල්ලුද කබායක් අඳියි. ඔහුගේ බඳ වටා පටියක් ද කරෙහි දමන ලද පටියක් වැනි උතුරු සළුවක් ද ඇත. ඔහු විශාල බනාවකට සමාන හුලස් තොප්පියක් පළඳී. අත් වලට සහ පාද වලට වළලු ද ගිගිරි ද පළඳියි.  ඔහු එක් අතක පන්හිඳක් ද අනෙක් අතෙහි පුස්කොල පොතක් ද රැගෙන විත් ලියන ලෙසක් දක්වමින් නටයි.

ඉන්පසු සබයට එන්නේ දේශනාවාදීන් දෙනො ය. අනාගත වක්තෲ යන නමින් හැඳින්වෙන ඔවුහු ප්‍රේක්ෂකයනට නාටකයේ කතා වස්තුව විස්තර කර දක්වති. ඔවුහු මුඩු කොන්ඩයෙන් හා පොතේ ගුරුන්නාන්සේ මෙන් සුදු ලෝගුවකින් සරසී සිටිති.

ඉන් අනතුරුව සබයට එන්නේ හඬ දූතයෝ වෙති. ඔවුනට නියමිත වස්ත්‍රයක් නොමැත. කතාව යුරෝපය පසුබිම් වන කතාවක් නම් යුරෝපීය ඇඳුම් අඳිති. නැත්නම් පෙරදිග ඇඳුම් අඳිති.

ඉන්පසු සබයට එන්නේ රජ ඇමතිවරුන් ය. රජු සිංහාසනයේ හිඳගනියිත රජු ගිය පසු නලුවෝ පැමිණ කතාවට අනුරූප නාට්‍යය රඟ දක්වති.නාට්‍යය අවසන් වනුයේ මංගල ගීතය ගායනා කිරීමෙනි.

***පොතේගුරු***

සකල සිත් වෛද්‍ය නක්ෂත්‍ර
කිවි නළු ඈ සමගිනා
ළකල සකු මගධ ඉංග්‍රිසි ප්‍රන්ස
නෙ බස් දත්  මනා මෙනා
විපුල නැණ සුරගුරෙවි රුවින්
මන්මත් මෙනා
කොමඳ සෙල්ලන් ළමා එයි සබේ
දනන් මන් පිනමිනා

***සෙල්ලන් ළමා***

ස්වර්ණ රන්පට සළු ඉග ඇඳ
දකුණු හස්තේ පන්හිඳය සදිසි නෙක
වමය ලියන කොළ රැගෙන
දිප්ති වැකි සබයේ සපිරි සිංහාරයට පැමිණී

***දේශනවාදීන් දෙදෙනා***

ආචාරයට හේතු තපෝදන
සුසිල වු ගුරුතුමනි
ආයුබෝවන් මෙ ඔබ දැක මහත්
සොම්නසක් කැලඹූ නි
දෙවිතුම වරන් ලැබ අවා ගතාවක්
පලකරන මෙනි
ආවෙමි ඩෙන්මාර්ක් නගරයේ සිට සම්මුකොට
ඔබ ලසිනි

***එබසට දෙවැන්නා කියන්නේ මෙසේ ය***

අනාදි ස්වයම්භ වූ දෙවිතුමා
රකී ඔබ යහති නා
ආමි මේ මන් ඒ ලෙසිනා
කාරණ පැහැදීමට බර්ලින් නගරේ
සිට මන මෙනා
එ මෙනා දෙදෙනා අපි
නොවලසින් පහදා දෙමු අනාගත කාරනා




## තුන්වන සීනුව

*පළමුවෙන් ම සබයට එන්නේ බහුබූතයා ය. ඔහු සංස්කෘත නාට්‍යයෙහි එන විදූෂකයා සිහි කරන විහිළු කාරයා ය. ඔහුට කෝමාලි, බහුබූත කෝලමා, කොනංගි වශයෙන් නොයෙක් නම් ඇති බව පෙනේ.*



**ශ්‍රීනාත් මද්දුමගේ**

## පිටකොටුව සහ බක් මාසය

හිර වී ඇත කැවුම් සුසුම් ලන
වීදුරු කුඹු තුල කොණ්ඩ පිරිමැද....
එල්ලී තැනින් තැන
නිමි ඇඳුම්
නටමින් ගයයි ගී
දූවිලි සුළං සුවඳින් මත් වී....
වාසනා පත් මොර දෙයි
සූරමින් සොටු
වාසනාවන්තයින් සොයමින්.....
දහදිය සුවඳ පොරකයි
පෝලිමේ පියාඹන්නට
නැකතට පිඹින්නට ගිහි....
කපුටන් කාක් කාක් කියමින්
කොටමින් දුවයි
කොවුල් පැටියන්ට....

දුගියන් හිඟමින් ගියයි ගී රස
වයමින් තාලයට බෙලෙක් හඬ....
කිඹුලන් එල්ලී සිටී නූල්වල
ඩුම් ඩුම් හඬින්
ගිගුම් දෙන්නට රැය....
දරුවෙක් උරයි කිරි
එනතුරු අඬමින්
තිබුණත් දෙතන විටමින් සොයන
වැහැරනු මව්ගෙන්....

**- ලක්ෂ්මන් කොඩිතුවක්කු -**

